**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදි උපාධි පරීක්ෂණය, තුන්වන වසර-2020/21 (මාර්ගගත)**

# අන්තර්ජාතික මානුෂවාදී නීතිය

(කාලය පැ තුනයි)

සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව:06

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න

(විභාග අපේ අපේක්ෂකයන් ගේ අපහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.)

---

1. අන්තර්ජාතික රතුකුරුස ව්‍යාපාරයේ මුල්කාලීන බල වපසරිය සෙසු සහන කටයුතු කර විශාල ලෙස විකාශනය හා පුළුල් වී තිබුණ ද හි කේන්ද්‍රය ලෙස වෛද්‍යාධාර පැවතිණි මානුෂවාදී කටයුතු පිළිබඳ ව පවත්නා අති පුළුල් අපේක්ෂාවන් හේතුවෙන් covid 19 වසංගතය හමුවේ සහාය සහ උපදෙස් ලබා දෙන මෙන් අන්තර්ජාතික රතුකුරුස කමිටුව වෙතින් ඉල්ලා සිටිනු ලැබ තිබේ.
   ඉහත ප්‍රකාශය ඇසුරින්, අන්තර්ජාතික මානුෂවාදී නීතියෙහි ඓතිහාසික විකාශයන් හා මානුෂවාදී ක්‍රියාකාරිකයින්ගේ ක්‍රියාවන් අසීරු කාලයන්හිදී මනුෂ්‍යයන් වෙත සරණක් වී ඇති ආකාරයත්, තවදුරටත් අත්‍යවශ්‍ය සහනසැපයීම ට හැකි ආකාරයත්, සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

2. පහත **අ සහ ආ කොටස් දෙකටම** පිළිතුරු සපයන්න

ඩෝරා රාජ්‍යය හා ගෝලා රාජ්‍යය සන්නද්ධ ගැටුමක නිරතවී සිටියි. 2021 මාර්තු මැද භාගයේ දී ඩෝරා හී සන්නද්ධ හමුදාවන් ගෝලා හි අගනුවර අත්පත්කර ගන්නා ලදී. ඔවුන් සියලුම කාන්තාවන්ට රැකියාවට යෑම හෝ විශ්වවිද්‍යාලයට යෑම තහනම් කළ අතර, සියලුම බාලිකා පාසල් වසා දැමීමට නියෝග කරන ලදී. තවද ඩෝරා හමුදාවන් විසින් කාන්තා ශිෂ්‍යාවන්ට ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලැබූ පාසල්, ක්‍රීඩා සමාජ සහ සංස්කෘතික මධ්‍යස්ථානයන්ට ගිනි තබමින් සිටියි. ගෝලාවරුන් රටින් පැනය යාමට උත්සාහ ගත් අතර අන්තර්ජාතික ගුවන් තොටුපළට ළඟා වීමට උත්සාහ දැරුව ද ඩෝරා හමුදාව පාරවල් අවහිර කරමින්, රටින් පැනයාමට උත්සාහ දැරූ ගෝලා පුරවැසියන්ට වෙඩි තැබීමට පටන් ගත්හ. ඩෝරා හමුදාභටයින් ගැහැණු ළමයින් හා කාන්තාවන් පැහැර

ගනිමින් දූෂණයට ලක්කරන බව අන්තර්ජාතික මාධ්‍යන්හි වාර්තා විය. තවද ඩෝරාවරුන් ඔවුන්ගේ කඳවුරු තුළ කාන්තාවන්, ඔවුන් දැන් හමුදාභටයින්ගේ මනාළියන් බව පවසමින්, බලහත්කාරයෙන් රඳවාගෙන සිටින බවද වාර්තා විය.

(අ) ඔබ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ නීති උපදේශකයකු බව උපකල්පනය කරන්න. අන්තර්ජාතික මානුෂවාදී නීතිය විෂයෙහි විශේෂ අවධානය යොමු කරමින් ඉහත තත්ත්වය පිළිබඳව විශ්ලේෂණාත්මක වාර්තාවක් ලියන මෙන් ඔබගෙන් ඉල්ලා ඇත. වාර්තාව ලියන්න.

(ලකුණු 75)

(ආ) ඩෝරාවරුන් සහ ගෝලාවරුන් එකම රාජ්‍යයක සිටින සන්නද්ධ කණ්ඩායම් දෙකක් නම් ඔබගේ වාර්තාවේ යම් වෙනසක් වේ ද?

(ලකුණු 25)

3. සනා රාජ්‍යය සහ රෝමා රාජ්‍යය දශකයක් පුරාවට දේශ දේශසීමාවක් හේතුවෙන් සන්නද්ධ ගැටුමක නිරතවෙමින් සිටීති. පසුගිය වසරේ දී, දේශසීමාවේ පිහිටි රෝමා හමුදා කඳවුරක් අල්ලා ගැනීමට සනා හමුදාවන් සමත් වූ අතර ඔවුන්, රෝමා හමුදාභටයින් 100දෙනකු සහ, තුවක්කු වලින් සන්නද්ධව එම ප්‍රදේශය සංචාරය කරමින් සිටියා යැයි සනා හමුදාවන් චෝදනා කරනු ලැබූ, අසල නගරයේ තරුණයන් 25 දෙනකු රඳවා ගෙන සිටිති. ස්වාධීන අන්තර්ජාතික වාර්තාවක් පෙන්වා දෙන්නේ සනා හමුදාවන් දේශ සීමාවේ ඔවුනට අයත් පැත්තේ, මෙම අල්ලා ගත් පිරිසට නරක විදිහට සලකනු ලබන රහසිගත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන බවයි. රෝමා හමුදාභටයින් ට විරුද්ධව සනා අධිකරණයන්හි නඩු විභාග කර ඔවුන්ගේ රෝමා හමුදා සාමාජිකත්වය හේතුවෙන්, දඬුවමට යටත් කර තිබේ. මෙම අල්ලාගත් පිරිසට ප්‍රමාණවත් ආහාර හෝ සනීපාරක්ෂක පහසුකම් ලබා දී නොමැති අතර, සනා ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන පතල්වල ඔවුන්ව වැඩෙහි යොදවා තිබේ. රඳවාගෙන සිටින තම පුරවැසියන් වහාම නැවත එවන ලෙස රෝමා ආණ්ඩුව ඉල්ලා සිටීයි.

ඔබ අන්තර්ජාතික මානුෂවාදී සංවිධානයක නියෝජිතයෙකු බව උපකල්පනය කරන්න. අදාල අන්තර්ජාතික නීතියට හා නීති මූලධර්ම වලට අවධානය යොමු කරමින් මෙම තත්ත්වය ගැන වාර්තාවක් ලියන්න.

(ලකුණු 100)

4. පහත **<u>අ හෝ ආ කොටසට පමණක්</u>** පිළිතුරු සපයන්න.

(අ) ඔබ, අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම පිණිස නෛතික ආරක්ෂාණයක් නොමැති බවට ආරාධිත දේශකයා ප්‍රකාශ කළ මෑතකාලීන මාර්ගගත දේශනයකට ඇහුම්කන්දුන් නීති උපාධිධාරියකු බව උපකල්පනය කරන්න. දේශකයා තවදුරටත් කියා සිටියේ මොනයම් ආකාරයක හෝ සන්නද්ධ අරගලයක් පවත්නා අවස්ථාවකදී, පරිසරය විනාශ වන අන්දමින් අවි ආයුධ හෝ ක්‍රමවේද භාවිතා කිරීම සම්බන්ධයෙන් කිසිදු තැනැත්තෙකුට එරෙහිව නඩු පැවරිය නොහැකි බවයි. මෙම ගැටළුව පිළිබඳ පැහැදිලි කිරීමක් සහිතව කණිෂ්ඨ නීතිඥවරුන්ගේ සඟරාවට විශේෂාංග ලිපියක් ඉදිරිපත් කිරීමට ඔබ තීරණය කරයි.

අන්තර්ජාතික මානුෂවාදී නීතියේ අදාළ වන මූලධර්ම වලට විශේෂ අවධානය යොමු කරමින් විශේෂාංග ලිපිය කෙටුම්පත් කරන්න. ඔබගේ ලිපිය තුල සන්නද්ධ ගැටුම් වලින් උදාහරණ සහ අදාළ නෛතික ප්‍රතිපාදන ඇතුළත් විය යුතුය.

(ලකුණු 100)

(ආ) ටියාරා හා සිතාරා රාජ්‍යයන් එකිනෙකා සමඟ සන්නද්ධ ගැටුමක නිරතව වෙමින් සිටිති. සිතාරා හමුදාවන්ගේ අවිආයුධ ගබඩාවක් ලෙස හඳුනාගෙන තිබූ ඉලක්කයක් වෙත ප්‍රහාර එල්ල කරන ලෙස ටියාරා හමුදාව අණ දෙනු ලබයි. ප්‍රහාරය දියත් කරන දිනයේ දී, ප්‍රහාරය සිදු කළ ටියාරා ගුවන් හමුදා නිලධාරියාට ඉලක්කය තහවුරු කර කරගැනීමට නොහැකි වුවද, කලින් දිනයක දී ලද බුද්ධි වාර්තාවක් මත ඔහු මිසයිලය දියත් කරන ලදී. පසුව දැනගැනීමට ලැබුණේ එම ඉලක්කය අවිආයුධ ගබඩාවක් නොව, සිතාරා රාජ්‍යයේ පිහිටි ඓතිහාසික පුස්තකාලයක් හා උද්භිත උද්‍යාන සංකීර්ණයක් බවයි. එම ස්ථානයෙන් තුවාලකරුවන් 250ක් සහ එම සංකීර්ණයේ සේවක මණ්ඩලය හා සංචාරකයන්ගේ යැයි පෙනෙන මළසිරුර 50 ක් හමුවිය.

ඔබගේ මතය අනුව ඉහත සිදුවීම් සම්බන්ධයෙන් ටියාරා රාජ්‍යය හා එහි නිලධාරීන්ගේ අන්තර්ජාතික නෛතික වගකීම කුමක්විය හැකිද? ඔබගේ පිළිතුර අදාල අන්තර්ජාතික නෛතික ප්‍රතිපාදන, මූලධර්ම හා නඩු තීරණ ඇසුරින් තහවුරු කළ යුතුය.

(ලකුණු 100)

5. පහත <u>අ සහ ආ කොටස දෙකටම</u> පිළිතුරු සපයන්න.

(අ) දැනට කප්රා රාජ්‍යයේ කණ්ඩායම් කිහිපයක් අතර ගැටුම් පවතින අතර, ඉතාමත් මෑතකදී පැවැත්වූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල රැස්වීමේ දී මානුෂවාදී නීතිය උල්ලංඝනය කිරීම් හා බරපතළ යුද අපරාධ සිදුවීම් සම්බන්ධයෙන් චෝදනා ගණනාවක් ඉදිරිපත් විය. 'ජාතිමාමක සභාගය' නම් කණ්ඩායම හා කප්රාන් හමුදාව යනු මෙම ගැටුම් වල නියුතු ප්‍රධාන කණ්ඩායම් දෙකකි. කෙසේ වුවද ෂියාන් රාජ්‍යයෙන් අරමුදල් ලබා ගනු ලබන, කප්රාන් හමුදාවට පුහුණුව ලබාදෙමින් ගැටුම් වලට සහභාගි වන, බ්ලැක්ස්ට්‍රීම් නම් කණ්ඩායම දැනට තහවුරු කරගෙන ඇති උල්ලංඝණය කිරීම් වලින් අවම වශයෙන් භාගයකටවත් වඩා සිදුවීම් වලට වගකිව යුතු බවට චෝදනා ලැබ සිටියි.

ඉහත සිදුවීම්ට අදාල පාර්ශවයන්ගේ අන්තර්ජාතික නීති වගකීම් ක්‍රියාත්මක කිරීම් පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 50)

(ආ) ජියා රාජ්‍යය සන්නද්ධ ගැටුම් අවසන් වී වසර පහළොවක් පමණ වන අතර ඔවුන් තම හමුදාවන් එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ද යවනු ලබයි. ජියා විශ්ව විද්‍යාලයේ නීති පීඨය, අන්තර්ජාතික මානුෂවාදී නීතිය ස්වකීය විෂය නිර්දේශය ඉවත් කිරීමට තීරණය කර තිබෙන්නේ, දැන් එම විෂය ඉතාමත් අවම ශිෂ්‍ය සංඛ්‍යාවක් තෝරා ගන්නා නිසාවෙනි. ඔබ ජියා විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගම් නායකයා වේ. මෙම විෂය, විෂයනිර්දේශයන් ඉවත් කිරීමේ තීරණයට එරෙහිව පීඨ මණ්ඩලයට ලිපියක් ලියන මෙන් සාමාජිකයන් ඔබගෙන් ඉල්ලා සිටිති.

ඔබගේ තර්කය තහවුරු කිරීම් පිණිස ජියා රාජ්‍යයේ අන්තර්ජාතික නීති වගකීම් වලට විශේෂ අවධානය යොමු කරමින් ලිපිය ලියන්න.

(ලකුණු 50)

6. සමූල ඝාතක අවි යන වචනය එක්තරා කාලයක අපි විසින් යොදාගනු ලැබුවේ , රසායනික, ජීවවිද්‍යාත්මක හෝ න්‍යෂ්ටික අවි ආදී භෞතික ආස්තිත්වයක් විෂයයෙහිය. කෙසේ වුවද, අද ලෝකයේ, නිසි ඉලක්කයට එල්ල කළේ නම් අතිබිහිසුණු හානියක් කිරීමට පරිගණක කේත ඉරි කිහිපයකට හැකියාවක් තිබේ. එවැනි අවස්ථාවන් වලදී, අන්තර්ජාතික මානුෂවාදී නීතිය උල්ලංඝනය කරනු ලබන ඉලක්ක කිරීමේ තීරණ, සම්බන්ධයෙන් අපරාධමය වගකීම හඳුනාගැනීමට අතිශය අපහසු වනු ඇත.

ඔබ එකඟවන්නේ හිද? ඉහත ප්‍රකාශය යුදමය ක්‍රම සහ විධි හා වත්මන් අන්තර්ජාතික නීති රාමුව ඇසුරින් විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 100)

***************